# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2443/53 - 2025 ජූලි මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2025.07.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍ය, අනුර කරුණාතිලක වන මම, එකී මණ්ඩලයට යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ තලයියඩි, මුහුදු ජලයෙහි ලවණ ඉවත් කිරීමේ පවිත්‍රාගාරයට ජලය රැගෙන යාම සහ ඉන් පිටවන අපවිත්‍ර ජලය බැහැරකිරීමේ නළ එළීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත් කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**අනුර කරුණාතිලක,**
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍ය.

යොමු අංකය : MUDH/WS/LA/04/555
2025 ජූනි මස 30 වැනි දින,
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
සෙත්සිරිපාය අදියර II,
බත්තරමුල්ල.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වඩමාරච්චි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක J/428, මරුතන්කර්නි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තලයියඩි ගමේ පිහිටි, බලයලත් මිනින්දෝරු පී. පුෂ්පරාජා මහතා විසින් මැන සකස් කරන ලද අංක 7560 දරන මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 01 දරන "කඩට්කරෙයි මනල්" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි රූඩ් 1 පර්චස් 31.20 වන ඉඩම් කොටසඃ

මායිම්

| | | |
|---|---|---|
| *උතුරට* | - | මුහුදු වෙරළ |
| *නැගෙනහිරට* | - | සුවක්කන්පිල්ලේ ක්‍රිෂාන්ත් හිමිකම් කියන ඉඩම |
| *දකුණට* | - | ප්‍රාදේශීය සභා පාර |
| *බටහිර* | - | තර්මලිංගම් ඇලන් රොක්සි හිමිකම් කියන ඉඩම |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* 1. බර්නාඩ් ජෙගනාතන්
රන්දෙස්ගේඩ් හාර්න් 13,
9900 එෆ් ආර්, හාර්නෟ"
ඩෙන්මාර්ක්.

EOG 07 - 0034